# රටට නවයුගයක් උදාකළ සිරිමාවෝ

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු සභාපතිනි, දිවංගත අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ 22 වැනි ගුණ සැමරුම මෙම මස අදට (10 වැනිදාට) යෙදේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**



විශිෂ්ට නායකයන් මියගිය ද ඔවුන්ගේ නිවැරදි දැක්ම ඔවුන් ජීවත්ව සිටි කාලයට වඩා ඔවුන්ගේ අභාවයෙන් පසුව ප්‍රබලව මතුවේ. ලොව ප්‍රථම කාන්තා අගමැතිනිය වී දෙවතාවක්ම එම තනතුර හොබවමින් ජාත්‍යන්තර දේශපාලන වාර්තාවක් සනිටුහන් කළ සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක මැතිණිය ඉටු කළ ජාතික හා ජාත්‍යන්තර මෙහෙවර යුග යුග අමරණීය වේ.

1916 අප්‍රේල් මස 17 වැනිදා සබරගමු පළාතේ රදළ පෙළපතක උපත ලත් ඇය දෛවය විසින් ඇයට පැවරූ ජාතික මෙහෙවර විශිෂ්ටත්වයෙන් යුතුව නිමවා වර්ෂ දෙදහසේ ඔක්තෝම්බර් මස දහ වැනිදා ජාතියෙන් සමු ගත්තාය. අභාවයෙන් වසර විසි දෙකකට පසුවත් සිරිමාවෝ මැතිණිය විසින් ගෙන ගිය ජාතික ජාත්‍යන්තර ආර්ථික දේශපාලනික හා සමාජීය වැඩපිළිවෙළෙහි මහිමය නැවත නැවතත් වත්මන් දේශපාලන කරලියේ අවධානයට මෙන්ම සාකච්ඡාවට භාජනයවී තිබිණි. ඇයගේ ස්වජාතික දැක්මේ හා මෙහෙවරේ ඇති සරුබව යළි යළිත් තහවුරු වී ඇත.

නාමිකව ලත් නිදහස තුළින් අධිරාජ්‍යවාදී වහල් බැමිවලින් තැළී මිරිකී සිටි ජාතියක් ඉන් මුදා ගනිමින් මවුබිම තුළ පොදුජන යුගයක් බිහිකලා වූ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා සාහසික කුමන්ත්‍රණයක් තුළින් ඝාතනය කිරීමෙන් එතුමාගේ දේශජ දැක්මත් එකී දැක්මෙන් පරිණත අපේ ආදරණීය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මරා දැමීමට උත්සාහ ගත්තද කුමන්ත්‍රණකාරීන්ගේ එම අනර්ථකාරී උත්සාහයන් අසාර්ථක වන්නේ බණ්ඩාරනායකයන්ගේ අභාවයෙන් පසුව පක්ෂයේත්, මෙරට ප්‍රගතිශීලි දේශපාලන ව්‍යාපෘතියේත් යන දෙකෙහිම නායකත්වය එවකට සිටි පක්ෂ නායකයන්ගේ ඉල්ලීම මත මැතිණිය විසින් පක්ෂ නායකත්වය භාර ගැනීම නිසාය. භාරධූර වගකීම සියතට ගත්තේ කිසිදු ලාබ අපේක්ෂාවකින් නොවෙ 56 ආරම්භ කළ පොදුජන මෙහෙවර ඉදිරියට ගෙන යෑමට ඇය දිවි හිමියෙන් කැප වෙමිනි.

රක්ෂණ, බැංකු ආදී ආර්ථිකයේ මර්මස්ථාන රැසක් ජනසතු කළ ඇය ක්‍රියාත්මක කළ යම් යම් දේශපාලන තීන්දු තම දේශපාලන පැවැත්මට හානිකර වුවද, තමා විශ්වාසකල දේශපාලන දැක්මේ තිරසරව එල්බ සිටීම ඇය තුළින් මා දකින ඉතා ප්‍රබල චරිත ලක්ෂණයකි.

ලංකාව ශ්‍රී ලංකා ජනරජයක් බවට පත් කරමින් නව ජනරජ ව්‍යවස්ථාවක් හඳුන්වාදීම තුළින් ඇය ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තරව ද අවධානය හා ගෞරවය දිනා ගත්තාය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලංකා සම සමාජ පක්ෂය හා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ නායකයන් සමඟ එකට සිට ගනිමින් සමගි පෙරමුණ බිහිකළ ඇය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන මැදුම් පිළිවෙතෙහි පිහිටාලමින් මවුබිමට ගැලපෙන ප්‍රගතිශීලි පරිවර්තනයන් රැසක් සිදු කරලීමට සමත් වූවාය.

රටට නව කාර්මික ප්‍රතිපත්තියක් හඳුන්වා දෙමින් සමාජවාදී කඳවුරේ රටවල් රැසක අනුග්‍රහයෙන් රටතුළ සිමෙන්ති, කඩදාසි, වානේ හා රසායනික කර්මාන්ත රැසක් ස්ථාපිත කළාය.

සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම කච්චතිවු දූපතේ අයිතිය ලබා ගැනීම, සැතපුම් 200 ක මුහුදු සීමාවේ අයිතිය මෙරටට හිමිකර ගැනීම වැනි දීර්ඝ කාලයක් නොවිසඳුනු ගැටලු, ප්‍රශ්න රැසකට අපට වාසිදායක වන ලෙස විසඳුම් ලබා ගැනීමට හැකිවීම මුළු මහත් ජාතියේම වාසනාවකි.

ඇය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ඒ වටා ගොනු වූ ලක්ෂ සංඛ්‍යාත සාමාජිකත්වයත් සිය පණ සේ රැක්කා සේම ඔවුන්ට සැබවින්ම උපරිමයෙන් ඇලුම් කළාය. රාජ්‍ය බලය ඇතිව සිටිය දී මෙන්ම රාජ්‍ය බලය අහිමිව සිය ප්‍රජා අයිතිවාසිකම් උරුමය පවා නොමැතිව සිටිය දී පක්ෂය රැකීම හා එය ප්‍රවර්ධනය කිරීම එතුමියගේ කාර්ය භාරය විය.

සිරිමාවෝ මැතිණිය එදා ඉටුකළ ඒ උත්තුංග කාර්ය භාරය වර්තමානයේ ඉටු කරලීමේ වගකීම වත්මන් සභාපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත පැවරී ඇත. එම උත්සාහය සාර්ථකව ඉටු කරලීම සිරිමාවෝ මැතිණිය වෙත කෙරෙන උපරිම උපහාරයක් සේම එය වත්මන් යුගයේ ජාතික අවශ්‍යතාවය සහ කාර්යභාරය ලෙස ද මම දකිමි.

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපති**

**ෂාන් විජයලාල් ද සිල්වා**